සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( × ) ලකුණ යොදන්න.

01. උපතේ සිට මරණය දක්වා මිනිසාට නොයෙකුත් භාණ්ඩ හා සේවා අවශ්‍ය වේ. සේවා ව්‍යාපාර සඳහා නිදසුන් වන්නේ,
(1) පාන් නිෂ්පාදනය (2) ඇඳුම් නිෂ්පාදනය
(3) තැපැල් කාර්යාල (4) ටයර් නිෂ්පාදන

02. ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා විවිධ වූ නිෂ්පාදන සාධක අවශ්‍ය වේ. එයින් ප්‍රාග්ධනය යටතට පමණක් අයත් වන්නේ,
(1) මුදල්, යන්ත්‍ර, ගොඩනැගිලි (2) යන්ත්‍ර, ඉඩම්, අයිතිකරු
(3) සේවකයින්, කළමනාකරුවන්, අයිතිකරු (4) ස්වභාවික සම්පත්, මුදල්, ගොඩනැගිලි

03. නිෂ්පාදන සාධකයක් ලෙස භූමිය යන්න නිවැරදි ලෙස නිර්වචනය කර ඇත්තේ,
(1) ව්‍යාපාර අයත් ගොඩනැගිල්ල (2) ව්‍යාපාර අයත් භූමිය
(3) ඛනිජ සම්පත හා වන සම්පත පමණි. (4) ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලු සම්පත්

04. ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවය යනු කුමක්ද?
(1) ව්‍යාපාරයේ අයිතිකරුවන්ය. (2) ණය දෙන ආයතන වේ.
(3) ගනුදෙනුකරුවෝ වේ. (4) ව්‍යාපාර කෙරෙහි උනන්දු වන පාර්ශව

05. මූල්‍ය ආයතන ව්‍යාපාරය කෙරෙහි උනන්දු වන්නේ කුමන හේතුවක් මතද?
(1) බදු ගෙවීමට (2) තරගයට මුහුණ දීමට
(3) දෙන ලද ණය අයකර ගැනීමට (4) සාධාරණ වැටුප් ලබා ගැනීමට

06. කළමනාකරුවන් ව්‍යාපාර කෙරෙහි උනන්දු වන්නේ කුමන සාධක මතද?
(1) හිතකර දිරිගැන්වීම් ලබා ගැනීමට (2) ව්‍යාපාර සැලසුම් නිවැරදිව ක්‍රියාත්මක කිරීමට
(3) ව්‍යාපාර කටයුතු සුපරීක්ෂණයට (4) ශ්‍රම ඵලදායිතාවය වැඩි කිරීමට

07. ව්‍යාපාරයක සම්පත් මෙහෙයවීමට අවශ්‍ය තීරණ ගනු ලබන්නේ,
(1) සේවකයෝ විසිනි. (2) කළමනාකරුවෝ විසිනි.
(3) අයිතිකරුවෝ විසිනි. (4) ගනුදෙනුකරුවෝ විසිනි.

08. ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී අමුද්‍රව්‍ය, ප්‍රවාහන ආදී වෙනත් සේවා සපයන පාර්ශව මෙලෙස හඳුන්වයි.
(1) ගනුදෙනුකරුවෝ (2) සැපයුම්කරුවෝ
(3) කළමනාකරුවෝ (4) සම්බන්ධීකරුවෝ



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

09. පුද්ගලයින් තම ආදායමින් පරිභෝජනය සඳහා වැය නොකරන ප්‍රමාණය,
(1) ආයෝජන ලෙස හැඳින්වේ. (2) පිරිවැටුම් ලෙස හැඳින්වේ.
(3) අතිරික්තය ලෙස හැඳින්වේ. (4) ඉතුරුම් ලෙස හැඳින්වේ.

10. ව්‍යාපාර පරිසරයේ සිදුවූ සිදුවීම් කිහිපයක් පහත වේ. මේ අතරින් ආර්ථික පරිසරයට පමණක් අයත්වන සාධක ඇතුලත් පිළිතුර තෝරන්න.
A බැංකු ණය පොළී අනුපාතික අඩුවීම නිසා ණය සඳහා ඇති ඉල්ලුම ඉහළ ගොස් ඇත.
B නව රජයේ අයවැය ප්‍රතිපත්ති පිළිබඳව මාධ්‍ය දැනුවත් කරන ලදී.
C පවත්නා වසංගත තත්ත්වය නිසා විදේශ විනිමය අනුපාතයෙහි විචලනයන් දක්නට ලැබිණ.
D දේශීය කර්මාන්ත වල දියුණුවට අදාළ නව පනතක් ඉදිරියේදී ඉදිරිපත්වීමට නියමිතය.
(1) A, B හා C (2) A, C හා D (3) A හා B (4) A හා C

11. වර්තමානයේ වාණිජ බැංකු තම ගනුදෙනුකරුවන් වෙත හඳුන්වා දී ඇති දුරකතන බැංකු ක්‍රමය කිනම් නමකින් හඳුන්වන්නේද?
(1) දුරකතන බැංකු ක්‍රමය (2) ඊ බැන්කින් ක්‍රමය
(3) මොබයිල් බැංකු සේවය (4) ටෙලි බැංකු සේවය

12. ව්‍යාපාර ශක්තීන් හා අවස්ථා වන්නේ,
A කළමනාකරුවන්ගේ අත්දැකීම්. B ව්‍යාපාර සඳහා බදු පැනවීම.
C පාරිභෝගික ජීවන රටාව වෙනස් වීම. D සුවිශේෂී නිෂ්පාදන ක්‍රම භාවිත නොකිරීම.
(1) A පමණි. (2) A හා C (3) A හා D (4) B හා C

13. ප්‍රජාතාන්ත්‍රවාදී පාලනයේ ලක්ෂණ සහිත ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
(1) රාජ්‍ය සංස්ථා (2) සමූපකාර ව්‍යාපාර
(3) සමිති සංවිධාන (4) රාජ්‍ය දෙපාර්ථමේන්තු

14. පහත දැක්වෙන ව්‍යාපාර සංවිධාන අතරින් නීතිමය පුද්ගලභාවයක් ඇති ව්‍යාපාර සංවිධාන විශේෂය තෝරන්න.
(1) සංස්ථාපිත සමාගම් (2) රාජ්‍ය දෙපාර්තමේන්තු
(3) හවුල් ව්‍යාපාර (4) තනි පුද්ගල ව්‍යාපාර

15. කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම තුළින් ව්‍යාපාරයට,
(1) නීතිමය පුද්ගලභාවයක් හිමි වේ. (2) අනන්‍යතාවයක් හිමිවේ.
(3) අඛණ්ඩ පැවැත්මක් හිමිවේ. (4) බදු නිදහසක් හිමිවේ.

16. තනි පුද්ගල ව්‍යාපාර ලියාපදිංචි කළ යුතු ආයතනය වන්නේ,
(1) ව්‍යාපාර නාම රෙජිස්ටාර් කාර්යාලය (2) අදාළ ප්‍රාදේශීය සභාව
(3) අදාළ පළාත් සභාව (4) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

17. පහත X තීරුවේ ගිණුම් වර්ග ද, Y තීරුවේ ලෙජර් ගිණුම් කිහිපයක් ද වේ.

| X | | Y | |
|---|---|---|---|
| (i) | වත්කම් ගිණුම් | A | විකුණුම් ගිණුම |
| (ii) | වගකීම්ගිණුම් | B | ගැනිලි ගිණුම |
| (iii) | හිමිකම්ගිණුම් | C | උපකරණ ගිණුම |
| (iv) | ආදායම්ගිණුම් | D | ණයහිමි ගිණුම |
| (v) | වියදම්ගිණුම් | E | රක්ෂණ ගාස්තු ගිණුම |

X තීරුව හා Y තීරුව අනුපිළිවෙළින් ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,
(1) C, D, B, A, E (2) A, D, B, C, E (3) C, B, D, A, E (4) D, C, B, A, E

18. අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනුව කුමක්ද?
   (1) රු. 20,000 ක භාණ්ඩ අත්පිට මුදලට ගැනීම.
   (2) රු. 10,000 ක ණය හිමියන් පියවීම.
   (3) රු. 75,000 ක බැංකු ණය ගැනීම.
   (4) රු. 80,000 ක භාණ්ඩ රු. 100,000 ට ණයට විකිණීම.

19. පහත ලක්ෂණ අතරින් වත්කමක ලක්ෂණයක් නොවන්නේ,
   (1) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවීම.
   (2) ව්‍යාපාරයේ පාලනයට යටත්වීම.
   (3) වර්තමාන බැඳීමක් තිබීම.
   (4) අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම.

20. තරිඳුගේ ව්‍යාපාරයේ යම් දිනයකට ගිණුම්කරණ සමීකරණය පහත වේ.
   වත්කම් = හිමිකම් + වගකීම්
   550 000 = 375 000 + 175 000
   තරිඳුගේ නිවසේ දුරකතන මිල රු. 10,000 ක් ව්‍යාපාරයේ මුදලින් ගෙවූ පසු ගිණුම්කරණ සමීකරනය කෙසේවීද?

   (1) 540 000 = 375000 + 165 000     (2) 550 000 = 375000 + 175 000
   (3) 540 000 = 365000 + 175 000     (4) 550 000 = 365000 + 1685 000

21. ගනුදෙනුවක් සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන පහත දැක්වේ.

| | | |
|---|---|---|
| බැංකු ණය ගිණුම | හර | 50 000 |
| මුදල් ගිණුම | බැර | 50 000 |

   මෙම ගනුදෙනුව වන්නේ,
   (1) රු. 50 000 ක් ණය මුදලක් ලබාගැනීම.     (2) රු. 50 000 ක් ණය වාරිකය ආපසු ගෙවීම.
   (3) රු. 50 000 ක් ණයගැතියකු විසින් ගෙවීම.     (4) රු. 50 000 ක් ණයහිමියෙකුට ගෙවීම.

22. පහත A තීරුවේ මූලික පොත ද, B තීරුවේ මූලාශ්‍ර ලේඛනය ද දක්වා ඇත.

| A | | B | |
|---|---|---|---|
| (i) | මුදල් පොත | A | සුළු මුදල් ගෙවීම් වවුචරය |
| (ii) | පොදු ජ'නලය | B | ජ'නල වවුචරය |
| (iii) | ගැනුම් ජ'නලය | C | ලදුපොත |
| (iv) | සුළු මුදල් පොත | D | ගැනුම් ඉන්වොයිසිය |

   A තීරුවේ දැක්වෙන ලෙජර් ගිණුම B තීරුවේ දැක්වෙන ගිණුම් වර්ගය සමඟ ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,
   (1) CDAB     (2) CBDA     (3) BDCA     (4) DBAC

23. ව්‍යාපාරයට රු. 3 000 ක ලාභාංශ ආදායමක් ලැබී ඇත. මෙම ගනුදෙනුව සටහන් කලයුතු ගිණුම් වර්ග වන්නේ,
   (1) වත්කම් හා ආදායම්     (2) වත්කම් හා හිමිකම්
   (3) ආදායම් හා හිමිකම්     (4) වත්කම් හා වියදම්

24. මෝටර් රථයක් ණයට ගැනීම සටහන් කිරීමට උපයෝගී කරගන්නා මූලාශ්‍ර ලේඛණය කුමක්ද?
   (1) ගැනුම් ඉන්වොයිසිය     (2) ලදුපත     (3) ගෙවීම් වවුචරය     (4) වවුචරය

25. පහත ගිණුම් වර්ග අතුරෙන් ගැනිලි ගිණුම අයත් වන්නේ,
   (1) වත්කම් ගිණුම්වලට ය.     (2) වියදම් ගිණුම්වලට ය.
   (3) හිමිකම් ගිණුම්වලට ය.     (4) ආදායම් ගිණුම්වලට ය.

26. මූලික සටහන් පොත් සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ව්‍යාපාරයේ සියලුම ගැණුම්, ගැණුම් ජ'නලයේ සටහන් කරයි.
   (2) වත්කම් ණයට විකිණීම සටහන් කිරීමට උපයෝගී කරගන්නා මූලාශ්‍ර ලේඛණය ලදුපතයි.
   (3) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා යන්ත්‍රයක් ණයට ගැනීම පොදු ජ'නලයේ සටහන් කෙරේ.
   (4) ගනුදෙනුවක් සටහන් කිරීමට සුවිශේෂී මූලික පොතක් නැති අවස්ථාවක එය සටහන් කරනුයේ මුදල් පොතේ ය.

27. විදුලි උපකරණ නිෂ්පාදනය කරන ආයතනයක් විසින් තම ව්‍යාපාරය සඳහා යන්ත්‍රයක් ණයට ගැනීම සටහන් කරන මූලාශ්‍ර ලේඛණය වන්නේ,
   (1) ජ'නල් වවුචරය  (2) විකුණුම් ඉන්වොයිසිය
   (3) ගෙවීම් වවුචරය  (4) ගැණුම් ඉන්වොයිසිය

28. ලෙජරයේ ඇති ණයහිමි ගිණුම ......①...... වන අතර ලද පොලී ගිණුම ......②...... වේ. ඉහත ① හා ② ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) වත්කම් ගිණුමක්, වගකීම් ගිණුමත්  (2) ආදායම් ගිණුමක්, හිමිකම් ගිණුමත්
   (3) වගකීම් ගිණුමක්, ආදායම් ගිණුමත්  (4) වගකීම් ගිණුමක්, වියදම් ගිණුමත්

29. අයිතිකරු විසින් සිය පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන යන මුදල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වල සටහන් කරනුයේ,
   (1) නෛතික අවශ්‍යතාවයක් මතය.  (2) ගිණුම්කරණ ඒකක සංකල්පය නිසාය.
   (3) ව්‍යාපාරය හා අයිතිකරු එක් අයෙකු නිසාය.  (4) ගිණුම් තබන්නාගේ අවශ්‍යතාවය මතය.

30. රවිඳුගේ ව්‍යාපාරයේ 2020.01.01 දින වන විට සුළු මුදල් භාරකරු ළඟ රු. 250 ක් තිබුණි. එදින ප්‍රධාන මුදල් භාරකරු වෙතින් රු. 2 750 ක් ලබා ගත් අතර, ජනවාරි මස වියදම රු. 2 800 ක් විය. රවිඳුගේ ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම වනුයේ,
   (1) රු. 2 050 යි.  (2) රු. 2 750 යි.  (3) රු. 2 800 යි.  (4) රු. 3 000 යි.

31. ලී බඩු වෙළෙඳසැළක් හිමි ෂෙහාන්ගේ ව්‍යාපාරයේ උපුටාගත් ගනුදෙනු කීපයක් පහත දැක්වේ. එම ගනුදෙනු අතුරින් ගැනුම් ජ'නලයේ සටහන් කරන ගනුදෙනුවකි.
   (1) රු. 100 000 ක ලී බඩු උපකරණ අත්පිට මුදලට ගැනීම.
   (2) රු. 250 000 ක ලී බඩු උපකරණ ණයට ගැනීම.
   (3) රු. 400 000 ක මෝටර් රථයක් ණයට ගැනීම.
   (4) රු. 120 000 ක යන්ත්‍රයක් කුලී පදනමට ගැනීම.

32. විකුණුම් ජ'නලයේ එකතුව
   (1) විකුණුම් ගිණුමට හර කරයි.  (2) ණයගැති ගිණුමට හර කරයි.
   (3) විකුණුම් ගිණුමට බැර කරයි.  (4) ණයගැති ගිණුමට බැර කරයි.

33. සංලක්ෂයක් ලියනු ලබන මූලික සටහන් පොතකි.
   (1) ගැනුම් ජ'නලය  (2) පොදු ජ'නලය  (3) විකුණුම් ජ'නලය  (4) ඉහත සියල්ලම

34. බැංකු සැසඳුම් ප්‍රකාශයක ඇතුළත් කරන අයිතම පමණක් අන්තර්ගත ප්‍රකාශය වනුයේ,
   (1) ස්ථාවර නියෝග මත ගෙවීම්, බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත්
   (2) බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්, නිෂ්කාශනය නොවූ චෙක්
   (3) ඍජු ප්‍රේෂණ ලැබීම්, ස්ථාවර නියෝග මත ගෙවීම්.
   (4) ඍජු ප්‍රේෂණ ලැබීම්, නිෂ්කාශනය නොවූ චෙක්පත.

35. පසිඳුගේ ව්‍යාපාරයේ ණයගැතියෙකු වන ලසිත රු. 15 000 ක මුදලක් පසිඳුගේ බැංකු ගිණුමෙහි තැන්පත් කර ඇත. මේ හේතුවෙන්,

(1) බැංකු ප්‍රකාශනයේ ශේෂය බැංකු ගිණුමේ ශේෂයට වඩා වැඩි වේ.
(2) බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂයට වඩා වැඩි වේ.
(3) බැංකු ප්‍රකාශයේ ශේෂය බැංකු ගිණුමේ ශේෂයට වඩා අඩු වේ.
(4) මෙය බැංකු ප්‍රකාශයේ හෝ බැංකු ගිණුමේ ශේෂවල වෙනසකට බලපාන්නේ නැත.

36. ව්‍යාපාරයක දුන් වට්ටම් ගිණුම්ගත කිරීමට ආදළ නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(1) දුන් වට්ටම් ගිණුම හර
ණයගැති ගිණුම බැර
(2) දුන් වට්ටම් ගිණුම හර
ණයහිමි ගිණුම බැර
(3) ණයගැති ගිණුම හර
දුන් වට්ටම් ගිණුම බැර
(4) දුන් වට්ටම් ගිණුම හර
ගැණුම් ගිණුම බැර

37. එම්. ටෙක්ස්ටයිල්ස්හි 2019.12.31 දිනට සකස් කළ ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව රු. 7 000 කින් අඩුවිය. මෙම වෙනස සටහන් කළ යුත්තේ,

(1) අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයක් ලෙස ය.
(2) පොදු ජ'නලයෙහි සටහනක් ලෙස ය.
(3) අවිනිශ්චිත ගිණුමේ හර ශේෂයක් ලෙස ය.
(4) අදාළ ගිණුමෙහි හර ශේෂයක් ලෙස ය.

38. ලක්ෂාන්ගේ ව්‍යාපාරයේ 2020.03.20 දින සේවක වැටුප් රු. 15 000 ක් ගෙවීම මුදල් පොතට බැර කර වැටුප් ගිණුමට ද බැර කර ඇත. මෙම වරද නිවැරදි කිරීමේ ජ'නල් සටහන වනුයේ,

(1) මුදල් ගිණුම හර 15 000
වැටුප් ගිණුම බැර 15 000
(2) වැටුප් ගිණුම හර 15 000
අවිනිශ්චිත ගිණුම බැර 15 000
(3) වැටුප් ගිණුම හර 15 000
මුදල් ගිණුම බැර 15 000
(4) වැටුප් ගිණුම හර 30 000
අවිනිශ්චිත ගිණුම බැර 30 000

39. උපකරණ අලුත් වැඩියාව සඳහා වැයකළ රු. 14 000 උපකරණ ගිණුමට හර කර ඇත. මෙය නිවැරදි කළ යුත්තේ,

(1) උපකරණ ගිණුම හර 14 000
උපකරණ අලුත්වැඩියා ගිණුම බැර 14 000
(2) උපකරණ අලුත්වැඩියා ගිණුම හර 14 000
උපකරණ ගිණුම බැර 14 000
(3) උපකරණ අලුත්වැඩියා ගිණුම හර 28 000
උපකරණ ගිණුම බැර 28 000
(4) උපකරණ අලුත්වැඩියා ගිණුම හර 14 000
අවිනිශ්චිත ගිණුම බැර 14 000

40. ශේෂ පිරික්සුම සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) ගිණුම්වල හර කර ඇති අගය හා බැර කර ඇති අගය සමාන බව තහවුරු කර ගත හැකිය.
(2) ගිණුම් නිවැරදිව තුලනය කර ඇත්ද යන්න තහවුරු කර ගත හැකිය.
(3) හර එකතුව හා බැර එකතුව සමාන නම් ගිණුම් තැබීම නිවැරදි බව තහවුරු කර ගත හැකිය.
(4) ශේෂ ඇතුළත් ලේඛනයක් පමණක් වන අතර ලෙජරයේ සාරාංශයක් ලෙස ගත හැකිය.



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

වැදගත් :

- **පළමු ප්‍රශ්ණයටත් I කොටසින් ප්‍රශ්න දෙකක්ද,II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

COVID-19 වසංගත තත්ත්වය නිසාවෙන් ජනිත වූ හිතකර ප්‍රවණතාවක් ලෙස දේශීය නව ව්‍යවසායකයන්ගේ සහ කුඩා කර්මාන්තකරුවන්ගේ පිබිදීමක් දක්නට ලැබුණි. දේශීය පේෂකර්ම ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ විධිමත් අධ්‍යාපනයක් ලබා ඇති සෙනුරි ඉමල්ෂිකා තම සොයුරියගේද සහාය ඇතිව "සෙනූ විලාසිතා" නමින් දේශීය ඇගලුම් නිපදවීමේ ව්‍යාපාරයක් 2020/06/01 දින ආරම්භ කරන ලදී. රු. 25 000/- බැගින් වටිනාකමින් යුත් රෙදි විවීමේ යන්ත්‍ර දෙකක් හා ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පත් කර තිබූ රු. 800 000/- ක මුදල ව්‍යාපාරයට යොදවන ලදී.

2020/06/30 න් අවසන් වූ මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

| | | | |
|---|---|---|---|
| 06/01 | උපකරණ මිලට ගැනුම් | රු. | 80 000/- |
| 06/02 | 12% වාර්ෂික පොලියකට යටත්ව ලබාගත් බැංකු ණය | රු. | 700 000/- |
| 06/03 | ලංකා බැංකුවේ ජංගම ගිණුමක් ඇරඹීම | රු. | 1 000 000/- |
| 06/04 | අමුද්‍රව්‍ය මිලට ගැනුම් | රු. | 150 000/- |
| 06/04 | ප්‍රවාහන ගාස්තු | රු. | 5 000/- |
| 06/15 | අමුද්‍රව්‍ය ණයට ගැනුම් | රු. | 75 000/- |
| 06/25 | විදුලි බිල ගෙවීම (මේ සඳහා චෙක්පත් නිකුත කරන ලදී.) | රු. | 4 500/- |
| 06/28 | විකුණුම් ආදායම් (අත්පිට) | රු. | 25 000/- |

තවද රු. 200 000 ක් වටිනා ඡායාපිටපත් යන්ත්‍රයක් මෙට්‍රොපොලිටන් ආයතනයෙන් ණයට ලබා ගන්නා ලදී. මෙම මාසයට අදාළ බැංකු ණය පොළිය ද තවම ගෙවා නොමැත.

(i) (අ) මෙහි දැක්වෙන සිද්ධිය මගින් සපුරාලන මිනිස් අවශ්‍යතාව ලියා දක්වන්න. (ල.01)
(ආ) මෙහි දැක්වෙන ශක්තියක් ලියා දක්වන්න. (ල.01)

(ii) (අ) පරිමාණය අනුව මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් ද? (ල.01)
(ආ) සෙනුරි ඉමල්ෂිකා විසින් අවධානය දැක්වූ ව්‍යාපාර අවස්ථාව කුමක්ද? (ල.01)

(iii) (අ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය කුමන ව්‍යාපාර සංවිධාන විශේෂයට අයත් වේද? (ල.01)
(ආ) එම ව්‍යාපාර සංවිධාන විශේෂය පාලනය කරන්නේ කවුරුන් විසින්ද? (ල.01)

(iv) (අ) "සෙනූ විලාසිතා" ව්‍යාපාරය ලියාපදිංචිය අනිවාර්ය වේද? (ල.01)
(ආ) එහි ඇති නීතිමය තත්ත්වය පැහැදිලි කරන්න. (ල.01)

(v) "සෙනූ විලාසිතා" හි 2020/06/01 දිනට ගිණුම්කරණ සමීකරණය කෙබඳු වේද? (ල.02)

(vi) (අ) මාසය සඳහා වූ ව්‍යාපාරයේ ගැනුම් ගිණුම පිළියෙල කරන්න. (ල.01)
(ආ) ව්‍යාපාරයේ ණයහිමියන්ගේ වටිනාකම දක්වන්න. (ල.01)

(vii) ව්‍යාපාරයේ ජුනි මාසය සඳා වන බැංකු ණය පොළිය ගණනය කර දක්වන්න. (ල.02)

(viii) (අ) 2020/06/25 ගනුදෙනුව සඳහා වන ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල.01)
(ආ) ඊට අදාළ වන ගිණුම් ගත කිරීම් දක්වන්න. (ල.01)



මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.

(ix) 2020/06/25 දින ගිණුම්ගත කළ චෙක්පත අගරු වුණි නම් ඊට අදාළ ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල.02)

(x) මෙම ව්‍යාපාරයේ 2020/06/30 දිනට මුදල් පොත පිළියෙල කරන්න. (ල.02)

## I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) මිනිස් අවශ්‍යතා දෙකක් නම් කරන්න.

(ආ) වුවමනා යන්න නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල.02)

(ii) ඉහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න දක්වන්න. (ල.02)

(අ) අතිරික්තය අනෙකුත් පුද්ගලයින් සමඟ හුවමාරු කර ගැනීම බාටර් ක්‍රමය වේ. (................)

(ආ) සෑම ව්‍යාපාරයක්ම ලාභ අපේක්ෂාවෙන් කටයුතු කරයි. (................)

(ඇ) වර්තමානයේදී තමාට අවශ්‍ය සියලු දෑ තමා විසින් ම නිෂ්පාදනය කර ගනී. (................)

(ඈ) අත්හුරු ක්‍රමය පවත්වාගෙන ගිය බොහොමයක් ව්‍යාපාර අද නව තාක්ෂණය භාවිතා කරයි. (................)

(iii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වේගවත් වර්ධනය තුළින් ඇති වූ විද්‍යුත් මාධ්‍ය මගින් මුළු ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත්ව ඇත. මෙය මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීමේදී මහත් පහසුවකි.

(අ) වර්තමානයේ විද්‍යුත් මාධ්‍ය භාවිතා කරමින් ව්‍යාපාර කටයුතුවල නිරත වන ආකාරයන් 02 ක් නම් කරන්න.

(ආ) වුමවනාවල ලක්ෂණ දෙකක් ලියන්න. (ල.02)

(iv) සිතුග ගෙවතු වගාවක් ලෙස ඉඟුරු වගාව ආරම්භ කරන ලදී. මේ සඳහා නිවසේ පිහිටි භූමි ප්‍රදේශයක් යොදාගත් අතර පියාගේ සහ මවගේ නොමසුරු දායකත්වය ලැබුණි. අතිරික්ත ඉඟුරු නිෂ්පාදනය තේ කුඩු සමඟ මිශ්‍ර කොට නව පානයක් සකස් කොට සිතුග විසින් වෙළඳපොළට ජින්ජර් ටී (Ginger Tea) ලෙස බෝතල්වල අසුරා වෙළෙඳපොළට ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා තම පියාගේ ලොරි රථය යොදා ගත්හ. ලැබුණු මුදල්වලින් සිතුග විසින් නව යන්ත්‍ර සූත්‍ර කිහිපයක් ද මිලදී ගන්නා ලදී.

ඉහත සිද්ධියට අදාළව පහත දැක්වෙන නිෂ්පාදන සම්පත් සඳහා නිදසුන බැගින් ලියන්න.

| භූමිය | ශ්‍රමය | ප්‍රාග්ධනය | ව්‍යවසායකත්වය |
|---|---|---|---|
| (අ) ............... | (ආ) ............... | (ඇ) ............... | (ඈ) ............... |

(ල.02)

03. (i) (අ) ව්‍යාපාර පරිසරය යනු කුමක්ද?

(ආ) අභ්‍යන්තර පරිසර සාධක 02 ක් ලියන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න. (ල.02)

(අ) ගනුදෙනුකරුවෝ බාහිර පරිසරයට අයත් සාධකයක් වේ. (..................)

(ආ) ගෝලීය පරිසරය බාහිර පරිසරයට අයත් සාධකයක් වේ. (..................)

(ඇ) තරඟකරුවෝ අභ්‍යන්තර පරිසරයට අයත් සාධකයක් වේ. (..................)

(ඈ) දේශපාලන පරිසරය බාහිර පරිසරයට අයත් සාධකයක් නොවේ. (..................)

(iii) තාක්ෂණික වෙනස් වීම නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම් හඳුනාගෙන පහත වගුව සම්පූර්ණ කරන්න. (ල.02)

| ව්‍යාපාරවල අතීත භාවිතය | ව්‍යාපාරවල වර්තමාන භාවිතය |
|---|---|
| (අ) සරල අත්යන්ත්‍ර | (..................................................) |
| (ආ) සාමාන්‍ය තැපැල | (..................................................) |
| (ඇ) වෙළඳ දැන්වීම් සඳහා තැපැල් ලිපිනය | (..................................................) |
| (ඈ) පොත්වල ගිණුම් තැබීම. | (..................................................) |

(iv) අකීසා උසස් පෙළ තෙක් අධ්‍යාපනය හැදෑරූ සිසුවියක් විය. ඇගේ නිවස මුහුදු වෙරළට යාබඳව පිහිටා ඇත. ඇයගේ පියා ධීවර කටයුතුවල නිරතවන අතර, ප්‍රදේශයේ පිහිටි අනෙකුත් වෙළඳ සැල් වෙත මුහුදු මාළු ද බෙදාහරියි. පියාගේ පහසුව සඳහා අකීසා විසින් තම නිවස ඉදිරිපිට මුහුදු මාළු අලෙවි සැලක් ආරම්භ කරන ලදී. එම ව්‍යාපාරය අකීසා සී ෆුඩ්ස් (Akeesha Sea Food) ලෙස පවත්වාගෙන ගියහ.

(අ) අකීසාගේ ව්‍යාපාරයට ඇති තර්ජනයක් ලියන්න.

(ආ) අකීසාගේ ව්‍යාපාරයට ඇති ශක්තියක් ලියන්න. (ල.02)

04. (i) පාරමී විසින් මුහුණු ආවරණ අලෙවි කිරීම සඳහා ව්‍යාපාරයක් රු. 20 000 ක් යොදා ආරම්භ කර ඒ සඳහා ඇයගේ මිතුරියක් වන සරණීගෙන් රු. 10 000 ක ණය මුදලක් ලබා ගත්තාය. එම ව්‍යාපාරය සඳහා පාරමී විසින් "ගුණදම් මුහුණු ආවරණ' යන නම පාවිච්චි කිරීමට අදහස් කරන ලදී.

(අ) "ගුණදම් මුහුණු ආවරණ" ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් ද? (ල.01)

(ආ) "ගුණදම් මුහුණු ආවරණ" ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයෙහි ඇති වාසියක් සහ අවාසියක් දක්වන්න. (ල.01)

(ii) LOLC හෝල්ඩින්ස් PLC හි සේවකයින් විසින් පිහිටුවනු ලැබූ වයිල්ඩ් කැට්ස් ක්‍රීඩා සමාජය මගින් පවත්වාගෙන යන ආපන ශාලාවේ අලෙවි කිරීමට ජාතික පශු සම්පත් මණ්ඩලය (NLDB) මගින් සපයනු ලබන කිරි පැකට් සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

පහත AB සඳහා ඉහත සිද්ධියේ සඳහන් වන නිදසුන බැගින් ලියන්න.

A රාජ්‍ය අංශයේ ව්‍යාපාරය

B සමිති සංවිධානය (ල.02)

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද, අසත්‍ය ද යන්න සඳහන් කරන්න. (ල.02)

(අ) හවුල් ව්‍යාපාරයක අවම සාමාජික සංඛ්‍යාව දෙදෙනෙකු වන අතර, උපරිම සාමාජික සංඛ්‍යාව 20 කි. (...............)

(ආ) සංස්ථාපිත සමාගම් වල වගකීම සීමා සහිත වේ. (...............)

(ඉ) සමූපකාර සමිති ලියාපදිංචිය සිදුකරනු ලබන්නේ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ය. (...............)

(ඊ) රාජ්‍ය දෙපාර්තමේන්තු බොහෝ විට පවතින්නේ ජනතාවට අත්‍යවශ්‍ය වන සේවා සැපයීමට වේ. (...............)

(iv) (අ) අනෙකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂව සමූපකාර සමිතිවල ඇති අවාසි 02 ක් දක්වන්න. (ල.01)

(ආ) සංස්ථාපිත සමාගම්වල ලක්ෂණයක් වන නෛතික පුද්ගලභාවයන් තිබීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල.01)

## II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) ගිණුම්කරණය යනු කුමක්ද?

(ආ) ව්‍යාපාරයක අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බලපාන කරුණු දෙකක් ලියන්න. (ල.02)

(ii) තිස්ස පාසල් බෑග් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 2019.01.01 දින ආරම්භ කරන ලදී. එදින සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

(1) තිස්ස ව්‍යාපාරයට මුදල් යෙදවීම රු. 100 000

(2) ලී බඩු අත්පිට මුදලට ගැනීම රු. 20 000

(3) ගොඩනැගිල්ලට මාසික කුලිය ගෙවීම රු. 10 000

(4) බැංකු ණයක් ලබා ගැනීම රු. 50 000

(5) පාසල් බෑග් ණයට ගැනීම රු. 25 000

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.

| ගනුදෙනුව | වත්කම් | = | වගකීම් | + | අයිතිකරුගේ හිමිකම |
|---|---|---|---|---|---|
| 1 | මුදල් +100 000 | | | | ප්‍රාග්ධනය +100 000 |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |

(ල.04)

(ආ) ඉහත සඳහන් ගණුදෙනුවලින් පසුව 2016.01.01 දිනට තිස්සගේ ව්‍යාපාරයේ පහත සඳහන් අයිතමවල වටිනාකම වෙන වෙනම දක්වන්න.

(1) ජංගම නොවන වත්කම්

(2) ජංගම වත්කම්

(3) මුළු වත්කම්

(4) හිමිකම (ල.04)

(iii) ආලෝකගේ ව්‍යාපාරයේ 2019 ගිණුම් වර්ෂය සඳහා පහත තොරතුරු ඔබ වෙත සපයා ඇත.

| | |
|---|---|
| ආරම්භක ප්‍රාග්ධනය | 450 000 |
| වර්ෂයේ මුළු ආදායම | 250 000 |
| වර්ෂයේ මුළු වියදම | 130 000 |
| අයිතිකරු යෙදූ මුදල් | 50 000 |
| අයිතිකරු සිදුකල ගැනිලි | 20 000 |

2019 දෙසැම්බර් 31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කර දක්වන්න. (ල.02)

06. (i) (අ) ව්‍යාපාරයක සුළු මුදල් පොතක් පවත්වාගෙන යාමේ ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල.½ x2=01)

(ආ) සුළු මුදල් පොතේ ලෙජර් ගිණුම තීරුවේ සටහන් කරන ගනුදෙනුවක් ලියන්න. (ල.01)

(ii) පහත වගුව සම්පූර්ණ කරන්න.

| මූලාශ්‍ර ලේඛනය | මූලික සටහන් පොත |
|---|---|
| (අ) ............................ | පොදු ජ'නලය |
| චෙක් පිලිපත | (ආ) ............................ |

(ල.02)

(iii) ප්‍රතිභාගේ ව්‍යාපාරයේ 2020.04.01 දිනට පැවති ශේෂ කීපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| බැංකු ශේෂය | රු. 22 000 |
| ණයගැති | රු. 30 000 |
| ණයහිමි | රු. 25 000 |

අප්‍රේල් මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

04/05 ණයගැතියෙකුගෙන් අංක 933 දරණ රු. 10 000 ක චෙක් පතක් ලැබුණි. එම චෙක්පත එදිනම බැංකුවේ තැන්පත් කළා.

04/10 මුදලින් රු. 15 000 ක් බැංකුවේ තැන්පත් කිරීම.

04/12 චෙක් අංක 507 යටතේ ණයහිමියන්ට රු. 24 700 ක් ගෙවීම මෙහිදී ලැබුණු වට්ටම රු. 300 කි.

04/15 ණය ගැතියෙකුගෙන් රු. 9 500 ක චෙක් පතක් ලැබුණු අතර, එය එදිනම බැංකුවේ තැන්පත් කරන ලදී. මෙහිදී දුන් වට්ටම රු. 500 කි. (චෙ.අ. 711)

අවශ්‍ය වන්නේ,

අප්‍රේල් මාසය සඳහා වට්ටම් තීරුව සහිත බැංකු ගිණුම සකස් කර තුලනය කිරීම. (ල.04)

(iv) පහත දැක්වෙන්නේ ලක්ෂිමාගේ ව්‍යාපාරයේ 2019.12.31 දිනට ලෙජර් ගිණුම්වල පැවති ශේෂයන්ය.

| | |
|---|---|
| ණයගැතියෝ | රු. 20 000 |
| ස්ථාවර තැන්පතු | රු. 200 000 |
| ණය හිමියෝ | රු. 40 000 |
| ඉඩම් හා ගොඩනැගිලි | රු. 500 000 |
| බැංකු ශේෂය | රු. 70 000 |
| ගැණුම් | රු. 177 000 |
| විකුණුම් | රු. 305 000 |
| දුන් වට්ටම් | රු. 3 000 |
| ලද වට්ටම් | රු. 5 000 |
| වැටුප් හා වේතන | රු. 10 000 |
| බැංකු ණය | රු. 200 00 |
| ප්‍රාග්ධනය | රු. 430 000 |

අවශ්‍ය වන්නේ,

ලක්ෂිමාගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම සකස් කර ප්‍රාග්ධනය සෙවීම. (ල.04)

07. (i) ව්‍යාපාරයක බැංකු ගිණුමකට හර කරන අයිතමයක් හා බැර කරන අයිතමයක් ලියන්න. (ල.02)

(ii) අවිනිශ්චිත ගිණුමක් යනු කුමක්ද? (ල.02)

(iii) නිලූෂිකාගේ ව්‍යාපාරයේ 2020 පෙබරවාරි මාසයේ බැංකු ගිණුමේ වාසිදායක ශේෂය රු. 30 000 ක් විය. බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 29 500 විය. එම වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය විය.

ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ වාරිකය රු. 3 000 කි.

තැන්පත් කරන ලද නමුත් නිෂ්කාශනය නොවූ චෙක් රු. 8 000 කි.

බැංකුවට සෘජුවම ලැබී ඇති ලාභාංශ ආදායම රු. 4 500 කි.

නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් වල වටිනාකම රු. 6 000 කි.

අවශ්‍ය වන්නේ,

(අ) පෙබරවාරි මාසය සඳහා සංශෝධිත බැංකු ගිණුම (ල.02)

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශය (ල.02)

(iv) (අ) ගිණුම්කරණයේදී වැරදි සිදුවිය හැකි අවස්ථා 02 ක් ලියන්න. (ල.02)

(ආ) ශේෂ පිරික්සුමේ සමානතාවයට බලපාන වැරදි දෙකක් හා ශේෂ පිරික්සුමේ සමානතාවයට බල නොපාන වැරදි දෙකක් ලියන්න. (ල.02)



*මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **තෙවන වාර පරීක්ෂණය 2020**

**10 ශ්‍රේණිය** **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(4) | 4 -(4) | 5 -(3) | 6 -(2) | 7 -(2) | 8 -(2) | 9 -(4) | 10 -(4) |
| 11-(4) | 12 -(2) | 13 -(2) | 14 -(1) | 15 -(2) | 16 -(3) | 17 -(1) | 18 -(4) | 19 -(3) | 20 -(3) |
| 21-(2) | 22 -(2) | 23 -(1) | 24 -(1) | 25 -(3) | 26 -(3) | 27 -(1) | 28 -(3) | 29 -(2) | 30 -(4) |
| 31-(2) | 32 -(3) | 33 -(2) | 34 -(2) | 35 -(1) | 36 -(1) | 37 -(3) | 38 -(4) | 39 -(2) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය - I කොටස

01. (i) (අ) ඇඳුම් පැළඳුම් (ල.01)

(ආ) - දේශීය පේෂකර්ම ක්ෂේත්‍රය පිළිබඳව වෘත්තීය පුහුණු අධිකාරියෙන් ලබාගත් විධිමත් අධ්‍යාපනය

- ප්‍රමාණවත් ප්‍රාග්ධනයකින් යුක්ත වීම. (ල.01)

(ii) (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (ල.01)

(ආ) දේශීය නව ව්‍යවසායකයන්ගේ හා කුඩා කර්මාන්ත කරුවන්ගේ දක්නට ලැබූ පිබිදීම. (ල.01)

(iii) (අ) රාජ්‍ය සංස්ථා (ල.01)

(ආ) රජය විසින් පත්කල අධ්‍යක්ෂ මණ්ඩලයක් මගිනි. (ල.01)

(iv) (අ) අනිවාර්ය වේ. (ල.01)

(ආ) මෙම ව්‍යාපාරය අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන නිසා අදාළ පළාත් සභා ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතුය. (ල.01)

(v) වත්කම් = හිමිකම් + වගකීම්

850 000 = 850 000 + - (ල.02)

(vi) (අ)

ගැනුම් ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| 06/04 | මුදල් | 150 000 | | | |
| 06/15 | ණය හිමියෝ | 75 000 | | | |

(ල.01)

(ආ) රු. 75 000/- (ල.01)

(vii) $700\,000 \times \frac{12}{100} \times \frac{1}{12} =$ රු. 7 000/= (ල.02)

(viii) (අ) විදුලි ගාස්තු ගිණුම හර 4 500

බැංකු ගිණුම 4 500 (ල.01)

(ආ)

විදුලි ගාස්තු ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| 06/25 | බැංකු | 4 500 | | | |

බැංකු ගිණුම

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 06/25 | විදුලි ගාස්තු | 4 500 |

(ල.01)

(ix) බැංකු ගිණුම හර 4 500

විදුලි ගාස්තු ගිණුම 4 500 (ල.02)

(x) (ල.02)

මුදල් පොත

| | | | | | |
|---|---|---|---|---|---|
| 2020 | | | | | |
| 06/01 | ප්‍රාග්ධනය | 800 000 | 06/01 | උපකරණ | 80 000 |
| 06/02 | බැංකු ණය | 700 000 | 06/03 | බැංකු | 1 000 000 |
| 06/28 | විකුණුම් | 25 000 | 06/14 | ගැණුම් | 150 000 |
| | | | | ප්‍රවාහන | 5 000 |
| | | | | ප/ගෙ | 290 000 |
| | | 1 525 000 | | | 1 525 000 |

## I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. (i) (අ) ආහාර, ඇඳුම්, නිවාස

(ආ) අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූප වුවමනා වේ.

ආහාර		බත්, කඩල

ඇඳුම්		සාරි, කලිසම් (ල.02)

(ii) (අ) සත්‍ය (ආ) අසත්‍ය (ඇ) අසත්‍ය (ඈ) සත්‍ය (ල.02)

(iii) (අ) ♦ භාණ්ඩ ඇණවුම් කිරීම ♦ මුදල් ගෙවීම. ♦ ප්‍රචාරණය

(ආ) ♦ අත්‍යවශ්‍ය නොවීම. ♦ විවිධ වීම. ♦ නිර්මාණය කළ හැකි වීම. ♦ සංකීර්ණ වීම. ♦ අසීමිත වීම. (ල.02)

(iv) (අ) ගෙවත්ත (ආ) ♦ සිතුගගේ ශ්‍රමය ♦ පවුලේ ශ්‍රමය

(ඇ) ♦ යන්ත්‍ර ♦ මුදල් ♦ ලොරිය (ඈ) සිතුග විසින් සිදු කරයි.

03. (i) (අ) ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී ඊට බලපෑම් ඇති කරන විවිධ සාධක ක්‍රියාත්මක වටපිටාවයි.

(ආ) අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන් (ල.02)

(ii) (අ) සත්‍ය (ආ) සත්‍ය (ඇ) අසත්‍ය (ඈ) අසත්‍ය (ල.02)

(iii) (අ) නවීන යන්ත්‍ර සූත්‍ර (ආ) දුරකථන, ඊ-මේල්

(ඇ) දුරකථන, ඊ-මේල් (ඈ) පරිගණක, තොරතුරු පද්ධති (ල.02)

(iv) (අ) අවට තරඟකාරී මුහුදු මාළු වෙළඳ සැල්, මුහුදු මාළු නොමැති කාලයක් උදා වීම. (වාරකන් කාලය)

(ආ) මුහුද ලඟ නිවස පිහිටා තිබීම, පියා ධීවර රැකියාවේ නිරත වීම. (ල.02)

04. (i) (අ) ඒක පුද්ගල / තනි පුද්ගල (ල.01)

(ආ)

| වාසි | අවාසි |
|---|---|
| ආරම්භ කිරීම පහසු වීම. | අයිතිකරුගේ වගකීම අසීමිත වීම. |
| සියලුම ලාභ අයිතිකරු සතු වීම. | අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම. |
| තීරණ ගැනීමේ ස්වාධීන බව. | නෛතික පුද්ගලභාවයක් නොමැති වීම. (ල.01) |

(ii) A - NLDB (ජාතික පශු සම්පත් මණ්ඩලය)

B - වයිල්ඩ් කැට්ස් ක්‍රීඩා සමාජය (ල.02)

(iii) (අ) සත්‍ය (ආ) සත්‍ය (ඉ) අසත්‍ය (ඊ) අසත්‍ය (ල.02)

(iv) (අ) ප්‍රාග්ධනය සීමිත වීම.

සමුපකාර ප්‍රතිපත්ති මතම කටයුතු කලයුතු වීම.

(ආ) සමාගමක් නීතිය ඉදිරියේදී නීතිමය පුද්ගලයකු ලෙස සැලකීම. (ල.01)

## II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) ව්‍යාපාරයන් කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු සැපයීමේ ක්‍රියාවලියයි.

(ආ) ♦ අමතර ප්‍රාග්ධනයක් යෙදවීම. ♦ ගැනිලි ♦ වියදම් ගෙවීම ♦ ආදායම් ලැබීම ♦ ලාභය / අලාභය (ල.02)

(ii) (අ)

| ගනුදෙනුව | වත්කම් | = | වගකීම් | + | අයිතිකරුගේ හිමිකම |
|---|---|---|---|---|---|
| (1) | මුදල් +100 000 | = | | | ප්‍රාග්ධනය +100 000 |
| (2) | මුදල් -20 000 ලී බඩු +20 000 | = | | | |
| (3) | මුදල් -10 000 | = | | | ගොඩනැගිලි කුලී -10 000 |
| (4) | මුදල් +50 000 | = | බැංකු ණය +50 000 | | |
| (5) | මුදල් +25 000 | = | ණය හිමියෝ +25 000 | | |

(ආ) (1) ජංගම නොවන වත්කම් රු. 20 000
(2) ජංගම වත්කම් රු. 145 000
(3) මුළු වත්කම් රු. 165 000
(4) හිමිකම රු. 90 000 (ල.04)

(iii)

| | |
|---|---|
| ප්‍රාග්ධනය - 2019.01.01 | 450 000 |
| + ආදායම | 250 000 |
| අතිරේඛ ප්‍රාග්ධන යෙදවීම | 50 000 |
| - වියදම් | (130 000) |
| අයිතිකරු සිදුකල ගැනිලි | (20 000) |
| | **600 000** |

(ල.02)

06. (i) (අ) ♦ පාලනයකින් යුතුව සුළු මුදල් ගෙවීම් පවත්වාගෙන යාමට.
♦ ප්‍රධාන මුදල් භාරකරුගේ කාර්යය පහසු වීම. (ල.½ x2=01)

(ආ) ♦ ණය හිමියන්ට ගෙවීම.
♦ සුළු වටිනාකම සහිත වත්කම් මිලට ගැනීම. (ල.01)

(ii) (අ) ජ'නල් වවුචරය
(ආ) බැංකු ගිණුම (ල.02)

(iii)

මුදල් ගිණුම ල. ½

| | දිනය | විස්තරය | ස පි | වට්ටම් | වටිනාකම | දිනය | විස්තරය | ස පි | වට්ටම් | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ල. ½ | 4/01 | ශේෂය ඉ/ගෙ | | | 22 000 | 4/02 | ණයහිමි (507) ල. ½ | | 300 | 24 700 |
| ල. ½ | 4/05 | ණයගැති (933) | | | 10 000 | | | | | |
| ල. ½ | 4/10 | මුදල් | | | 15 000 | | | | | |
| ල. ½ | 4/15 | ණයගැති (711) | | 500 | 9 500 | | | | | |
| | | | | | | 4/30 | ශේෂය ප/ගෙ ල. ½ | | | 31 800 |
| | | | | 500 | 56 500 | | | | 300 | 56 500 |
| | 5/01 | ශේෂය ඉ/ගෙ | | ල. ½ | 31 800 | | | | | |

(ල.04)

(iv) ප්‍රතිභාගේ ව්‍යාපාරයේ
2020.04.30 දිනට ශේෂ පිරික්සුම

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ණයගැතියෝ | 20 000 | |
| ස්ථාවර තැන්පතු | 200 000 | |
| ණය හිමියෝ | | 40 000 |
| ඉඩම් හා ගොඩනැගිලි | 500 000 | |
| බැංකු ශේෂය | 70 000 | |
| ගැණුම් | 177 000 | |
| විකුණුම් | | 305 000 |
| දුන් වට්ටම් | 3 000 | |
| ලද වට්ටම් | | 5 000 |
| වැටුප් හා වේතන | 10 000 | |
| බැංකු ණය | | 200 000 |
| ප්‍රාග්ධනය | | 430 000 |
| | 980 000 | 980 000 |

(ල.04)

07. (i) ලියා ඇති අයිතම අනුව ලකුණු 01 බැගින් දෙන්න. (ල.02)

(ii) ශේෂ පරික්සුමේ හර ශේෂ එකතුව හා බැර ශේෂ එකතුව අතර වෙනසක් ඇති විටෙක ඊට හේතු වූ ගිණුම්කරණ වැරදි සොයා ඒවා නිවැරදි කරන තෙක් ශේෂ පිරික්සුමේ වෙනස තාවකාලිකව සටහන් කරන ගිණුම අවිනිශ්චිත ගිණුම නම්වේ. (ල.02)

(iii) (අ) සංශෝධිත බැංකු ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 30 000 | ස්ථාවර නියෝග | 3 000 |
| ලාභාංශ | 4 500 | ප/ගෙ/ශේ. | 31 500 |
| | 34 500 | | 34 500 |
| ශේ/ඉ/ගෙ | 31 500 | | |

(ල.02)

(ආ) නදීකාගේ ව්‍යාපාරයේ
2020 පෙබරවාරි මස සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය

| | | |
|---|---|---|
| සංශෝධිත බැංකු ශේෂය | | 31 500 |
| එකතු කළා :- | | |
| බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත | 6 000 | 6 000 |
| | | 37 500 |
| අඩු කළා :- | | |
| නිශ්කාශනය නොවූ චෙක්පත | 8 000 | (8 000) |
| 2020.04.30 දිනට බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂය | | 29 500 |

(ල.02)

(iv) (අ)
- මූලික සටහන් පොත්වල සටහන් කිරීමේදී
- ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේදී
- ගිණුම් තුලනය කිරීමේදී
- ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී (ල.02)

(ආ) වෙනසට බලපාන
- ද්විත්ව සටහනෙන් එක් සටහනක් පමණක් ඇතුළත් වීම.
- ද්විත්ව සටහනෙන් එක් සටහනක් නිවැරදිව සටහන් කර අනෙක් සටහන වැරදියට සටහන් කිරීම.

වෙනසට බලනොපාන
- ගනුදෙනුව සම්පූර්ණයෙන්ම මඟ හැරීම.
- ගනුදෙනුවේ වටිනාකම මූලික පොත්වල වැරදියට සටහන් වීම. (ල.02)